ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	183

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்	:	நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்	:	183

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution	:	Ministry of Finance, Economic Stabilization and National Policies
Parliamentary Series	:	183

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	183

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

පටුන

අනු අංකය	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව	පිටු අංකය
1.	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	1
2.	කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය	2
3.	නීති කටයුතු දෙපාර්තමේන්තුව	3
4.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව	5
5.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	7
6.	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව	8
7.	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	9
8.	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව	10
9.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	11
10.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	14
11.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	15
12.	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	16
13.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	17
14.	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	18
15.	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	20
16.	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව	25
17.	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	30
18.	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව	31
19.	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	32
20.	ශ්‍රී ලංකා රේගුව	33

21.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	**36**
22.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	**39**
23.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	**43**
24.	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව	**45**
25.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	**48**

දෙපාර්තමේන්තුවේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **183**

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	කොවිඩ් 19 වසංගත තත්ත්වය හා රටතුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂණ කටයුතු සිදු කිරීමට ප්‍රායෝගිකව නොහැකි වූ බව හා මේ වන විට ඉන්ධන ගැටළුව බොහෝ දුරට සමනය වී ඇති බැවින්, 2023 වර්ෂයේ සිට මේ සම්බන්ධව පරීක්ෂා කර බැලීමට අදාළව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ණය ශේෂවලින් කිහිපයක් කපා හැරීමට කටයුතු කර ඇති අතර අනෙකුත් ණය ශේෂ අය කර ගනිමින් පවතී.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	ඒ වන විට මාණ්ඩලික නිලධාරීන්ගේ පමණක් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතවීම සිදු වූ අතර, මේ වන විට කළමනාකරණ සේවා නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ඩී. එච්. එස්. පුල්ලපෙරුම
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **183**

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පැවති කොවිඩ් 19 වසංගත වාතාවරණය යටතේ 2020 වර්ෂයේ අපේක්ෂිත පරිදි පුහුණු වීම් සිදු කිරීමට නොහැකි විය. 2021 වර්ෂයේ දී MF/NB/07/CM/2021/163 හා 2021.08.28 දිනැතිව නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි 2021 වර්ෂයේ දී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ වියදම් අඩු කර ඒ අනුව පුහුණු අවස්ථාවන් සිදු කල අතර 2022 වර්ෂයේ සැලසුම් කළ පරිදි පුහුණු කටයුතු සිදු කරන ලදී.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

කොම්ප්ට්‍රෝලර් ජනරාල්
කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

මෙ. ඒ. රම්‍යා කාන්ති
කොම්ප්ට්‍රෝලර් ජනරාල්
කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : නීති කටයුතු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
නිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	ප්‍රමාද දෝෂයකින් අදාළ විස්තර යොමු කිරීම සිදු කර නොමැත. එය කඩිනමින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	නීති කටයුතු දෙපාර්තමේන්තුව මගින් අයවැය ක්‍රියාවලියට ඇතුළු මූල්‍ය කළමනාකරණයට අදාළ විවිධ නීති රෙගුලාසි හා කෙටුම්පත් සකස් කිරීමේදී, මූල්‍ය ගිවිසුම් සකස් කිරීමේදී, මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ඇතිවන නඩු හා පැමිණිලිවලට අදාළ කටයුතු, විවිධ ගිවිසුම්වලට අදාළ නීතිමය කටයුතු ආදිය සම්බන්ධයෙන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම ආදී කාර්යයන්හි නියැලෙන අතර, සෘජුවම මහජනතාව සමඟ සම්බන්ධවීමක් සිදු නොවේ. එබැවින් ප්‍රායෝගිකව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බව නිරීක්ෂණය වේ.
රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසිපරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව ඉතා අවම කාර්ය මණ්ඩලයකින් පවත්වාගෙන යන අතර ඒ වනවිට මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කර නොතිබූ නමුත් නිලධාරීන්ට අවශ්‍ය පුහුණු අවස්ථා ලබා ගැනීමට ඉල්ලීම් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. එලෙස ලැබෙන ඉල්ලීම් අනුව අවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම සිදු කර ඇත. මේ වනවිට 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර, ඒ අනුව ඉදිරියට වඩාත් ප්‍රළුල් ලෙස පුහුණු අවස්ථා සලසාදීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපේක්ෂිතයි.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2023 වර්ෂය සඳහා සකස් කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම්කර නොතිබුණි.	මේ වනවිට ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම්කර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. (2023.04.03 දිනැතිව)
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු	2020 වසරේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත පුහුණු අවස්ථා ලබාදීම සීමා විය. නමුත් 2023

මට්ටමක පැවතුණි.	වර්ෂය සඳහා දේශීය පුහුණුවීම් සඳහා අයවැය මගින් ප්‍රතිපාදන නොපවතින පසුබිමක වුවද උපරිම ආකාරයෙන් අයවැයගත නොවන පුහුණු අවස්ථා ලබාදීමට නියමිතයි.
අයවැය වක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගතකර නොතිබුණි.	මේ පිළිබඳ අධ්‍යයනයක් සිදු කර කඩිනමින් ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.
ආයතන විසින් ඉටුකරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් පළමු කාර්ය සාධක දර්ශකයේ ලහාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. හඳුනාගත් දෙවන කාර්ය සාධක දර්ශකයේ ලහාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. හඳුනාගත් තුන්වන කාර්ය සාධක දර්ශකයේ ලහා වීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	රටේ පැවැති තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තුවේ නව නීති සකස් කිරීමේ කටයුතු ප්‍රමාදවීම තුළින් මෙලෙස කාර්ය සාධක දර්ශකවලට ලහාවීම සීමා වී ඇති බව නිරීක්ෂණය වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නීති කටයුතු දෙපාර්තමේන්තුව

A. K. D. D. Arandara
Attorney-at-Law, Notary Public
Commissioner for Oaths
Additional Director General
Legal Affairs Department
Ministry of Finance, Colombo 0

දෙපාර්තමේන්තුවේ නම : කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/64 දරණ චක්‍රලේඛයේ විධිවිධාන අනුව සිදුකිරීමට නියමිත තිරසාර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කිරීමට නියමිත නියෝජිතයින් දෙදෙනාගේ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි	තිරසාර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන් දෙදෙනෙකු නම් කර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක DMA/ADM/APR/2020 සහ 2021.11.03 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශයට දන්වා ඇත. ❖ අධ්‍යක්ෂක - බී.ජී.තිසාර මයා ❖ අධ්‍යක්ෂක - එච්.එම්.පී.සී.කේ.කුමාරිහාම් මහත්මිය
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂය සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පුහුණු වැඩමුළු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරුන් සඳහා හා පළාත් සභා හා පළාත් පාලන ආයතනවල කාර්යය මණ්ඩලය සඳහා පැවැත්වීමට සූදානම්කර තිබුණද 2021 වර්ෂය පුරා පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටම වසා දැමීම ,ප්‍රාදේශියව වසා දැමීම හා පුද්ගල රැස්වීම් නවතා දැමීමට කෙරුනු නියෝග යනාදිය නිසා එම පුහුණු වැඩමුළු අපේක්ෂිත පරිදි පැවැත්වීමට නොහැකි විය. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කර පැවැත්වීමේදී එම පළාත් සභා වෙත ගොස් අදාල නිලධාරීන් එම පළාත් සභාව වෙත කැඳවා පුහුණු කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ නමුත් මෙම පුහුණු වැඩමුළු සංවිධානය කර පැවැත්වීම සඳහා 2021 වර්ෂයේ පැවති ප්‍රයෝගික දුෂ්කරතා මඟ හරවා ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් ZOOM තාක්ෂණය ඔස්සේ පුහුණු වැඩමුළු පැවැත්වීම 2021 ඔක්තෝම්බර් මස සිට ආරම්භ කරන ලදී. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා පුහුණු වැඩමුළු 10 ක් පැවැත්වූ අතර එම වැඩමුළු අතරින් 4 ක් සඳහා පළාත් සභා හා පළාත් පාලන අභ්‍යන්තර විගණකවරුන් සහභාගී කරවා ගන්නා ලදී. ඒවා නම් 1. නවක අභ්‍යන්තර විගණකයින් සඳහා පුහුණු වැඩමුළුව (2021.02.23) 2. ප්‍රසම්පාදන පිළිබඳ පුහුණු වැඩමුළුව

	(2021.10.21/25) 3. නවක අභ්‍යන්තර විගණකවරුන් සඳහා වූ පුහුණු වැඩමුළුව (2021.11.03/05) 4. අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම පිලියෙල කිරීම සඳහා වූ පුහුණු වැඩමුළුව (2021.11.16) ඒ තුලින් 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය මධ්‍යයේ වුවද යම් අපේක්ෂිත මට්ටමක් ලහා කර ගත හැකි විය.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2018/04/27 දිනැති අංක MSDW/08/65 දරණ වක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබීම.	අංක MSDW/08/65 හා 2018.04.27 දිනැති වක්‍රලේඛ විධි විධාන අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් දෙදෙනකු නම් කර, අංක DMS/AO/Sus.Dev. හා 2022.02.15 දිනැති ලිපියෙන් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

Hiransa Kaluthantri
Director General
Department of Management Services
General Treasury
Colombo - 01.

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
අඩුපාඩු කිසිවක් නොමැත.	අදාළ නැත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

ජ.නී. රත්නසීලි
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු/ කාරක සභාව විසින් ලබාදුන් නියෝග	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම/ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය
අඩුපාඩු කිසිවක් නොමැත.	අදාළ නැත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

එච්. සී. ඩී. එල්. සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

දෙපාර්තමේන්තුවේ නම : තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම.	අතිරික්ත සහ ඌනතා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයන්ට අනුව පොත් වලට ගලපා ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම.	දෙපාර්තමේන්තුව සඳහා සංචිත වාහන නොමැති අතර, පවතින්නේ අධ්‍යක්ෂ ජනරාල් වරයා සඳහා වෙන් කරන ලද වාහනය පමණි. එම වාහනය සඳහා ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාව සිදු කිරීමට දැනට සැලසුම් කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම.	කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ කොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ගිහ ණය ශේෂ පැවතුණි	**I.එස්.එල්.සෝමචන්ද්‍ර මහතා - කාර්යාල කාර්ය සහායක** වැඩ තහනමට ලක් වී ඇති එස්.එල්.සෝමචන්ද්‍ර මහතාගේ ණය ශේෂය රු:332, 459.00 කි. එය පහත සඳහන් ණය මුදල් වලින් සමන්විත වේ. පාපැදි ණය රු: 5,232.00 දේපල ණය රු: 185,621.00 ආපදා ණය රු: 140,106.00 උත්සව අත්තිකාරම් රු: 1,500.00 මෙහි සඳහන් ආපදා ණය මුදල සහ උත්සව අත්තිකාරම් ශේෂය අය කර ගැනීම සඳහා 2022.07.29 දින කොළඹ දිසා අධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. 2023.06.12 වන දින කඩුවෙල අධිකරණයට පාපැදි ණය සහ දේපල ණයට අදාළව ලේඛන ගොනු කරනු ඇත. **ඩබ්ලිව්.එම්.අමරසේන මහතා - කාර්යාල කාර්ය සහායක** මෙම දෙපාර්තමේන්තුවේ සේවය කළ කාර්යාල කාර්ය සහායක ඩබ්ලිව්.එම්.අමරසේන මහතා සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත 2020.02.25 දින සිට රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇත. ඒ අනුව, ඔහුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයට අයවිය යුතු රු:216,900.00 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු සිදු වෙමින් පවතින බව දන්වා සිටිමි.
තොරතුරු දැනගැනීමේ පනතට අනුව තොරතුරු ලබා දීම සඳහා නිශ්චිත නිලධාරියෙකු පත් කර නොතිබීම	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරි ලෙස අධ්‍යක්ෂ, ආර්.ජේ.ආබ්දීන් මිය පත් කර ඇත
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබීම	මහජනතාවට අප දෙපාර්තමේන්තුවේ තොරතුරු මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (https://www.treasury.gov.lk/) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ ලබා ගත හැක. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් (PED-MIS) රාජ්‍ය ව්‍යවසායන්ට අදාළ තොරතුරු ලබා ගත හැක.

තිරසර අරමුණු හඳුනාගෙන නොතිබීම	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු 03 ක් මේ වන විට හඳුනා ගෙන ඇත. **<u>අරමුණ 01</u>** ඵලදායිතා ක්‍රියාකාරකම්වලට අනුකූලව ව්‍යවසායකත්ව සහ නිර්මාණශීලීත්වයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම (SDG.8.3) **<u>අරමුණ 02</u>** සියලු සමාගම් තිරසාර සංවර්ධනයක් යොදා ගැනීමට පෙළඹවීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ ක්‍රියාවලියට තිරසාර තොරතුරු ඒකාබද්ධ කිරීම (SDG.12.5) **<u>අරමුණ 03</u>** ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා අනුව තිරසාර මහජන ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම (SDG.12.7)
තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබීම	**<u>අරමුණ 01 සඳහා අදාළ ඉලක්ක</u>** ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම (41) අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සැපයීම (111) ඉහළ, මධ්‍යම, පහළ මට්ටම් ලෙස ප්‍රමුඛතාගත අධීක්ෂණ මට්ටම අනුව රාජ්‍ය ව්‍යාපාර කාලීනව අධීක්ෂණය කිරීම (165) රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/ නිරාකරණය කිරීම (2750) රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (05) **<u>අරමුණ 02 සඳහා අදාළ ඉලක්ක</u>** රාජ්‍ය ව්‍යාපාර වල කාර්යසාධනය අධීක්ෂණය කිරීම (151) දත්ත පද්ධතිය හරහා රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීම (101) **<u>අරමුණ 03 සඳහා අදාළ ඉලක්ක</u>** රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති, බාහිර විගණකවරු ඵලදායී විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම (68) පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම (27) පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම්වලට සහභාගී වීම (31)

	වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම (140)
ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබීම	තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව පහත සඳහන් පරිදි වේ. 1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,කෘෂිකර්ම 2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රතිපත්ති 3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සේවා 4. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,කර්මාන්ත
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ වක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබීම	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පහත සඳහන් නිලධාරීන් පත් කර ඇත. 1. බී.ඒ.ටී.රොඩ්රිගෝ මයා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් 2. ආර්.ජේ.ආබ්දීන් මිය අධ්‍යක්ෂ
පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක නොකිරීම	ඉදිරියේදී පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගතිමි
පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම	ඉදිරියේදී පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කර ගතිමි

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

පී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම ණය ශේෂ මේ වන විට නිරවුල් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ්. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ වෙමි. 2022 වර්ෂයේ සිට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරන රා.ප. චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ වෙමි. 2021 වර්ෂයේ සිට අඛණ්ඩව මෙම දෙපාර්තමේන්තුවේ සංචිත වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇත. ඒ අනුව 2021 සහ 2022 වර්ෂ සඳහා ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇති බවත් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි.
මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	නිරීක්ෂණ හා එකඟ නොවෙමි. රියදුරු මහතුන් විසින් 2020 වර්ෂයේ සිදු කළ අමතර අතිකාල සහ ගමන් වියදම් වෙනුවෙන් 2021 වර්ෂයේදී පිළිවෙලින් 1002 වැය විෂය වෙනුවෙන් රු. 40,103ක් සහ 1101 වැය විෂය වෙනුවෙන් රු. 4,250ක මුදලක් ගෙවීම් කර ඇත. මෙම වියදම් මු.රෙ. 94 (2) වගන්තිය ප්‍රකාරව "වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම්" ස්වරූපයේ වියදම් යටතට ගැනෙන බැවින් අදාළ ගෙවීම් 2021 වර්ෂයේ ප්‍රතිපාදන භාවිතයෙන් සිදු කර ඇති බව දැනුම් දෙමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කේ. ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි. 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2ක් පවත්වා ඇත. කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම, අත්‍යවශ්‍ය සේවා කැඳවීම් කිරීමට දෙපාර්තමේන්තුවේ වාහන අනුයුක්ත කර තිබීම ආදී හේතූන් මත ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට හැකියාවක් නොතිබුණි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් පුහුණු සඳහා නිලධාරීන් කැඳවීම, රැස්කිරීම සීමා කිරීමට සිදු වූ බැවින් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් සහභාගී කරවා ගැනීමට නොහැකි විය.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් සිදු කරන ලෙස විෂය භාර නිලධාරීන් දැනුවත් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආචාර්ය එම්.කේ.ඩී. ජේකානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් අතිරික්ත, ඌනතා පිළිබඳව අනාවරණය කර නොමැත. 2020 භාණ්ඩ සමීක්ෂණය මඟින් ඉවත් කල යුතු බවට නිර්දේශ කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මිල කමිටුව 2021.08.18 දින පත්කර ඇත. මිල කමිටුවේ නිර්දේශ 2021.10.06 දින ඉදිරිපත් කර ඇත. එම භාණ්ඩ මු.රෙ.747 යටතේ විකිණීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට 2021.10.14 දින ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021.10.27 දින ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. 2021.11.23 දින එම භාණ්ඩ වෙන්දේසියේ විකිණීමෙන් ලද රු.27,140/= ක මුදල ආදායමට බැර කර ඇත. 2020 භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ අනුව, බිම් මහල නවාකරණයේදී ගලවා ඉවත් කරන ලද අබලි දුව්‍ය විකිණීමට අදාලව 2021.10.14 දින තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇත. 2021.10.18 දින පුවත්පත් දැන්වීමක් මඟින් ලංසු කැඳවා ඇත. ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වැඩිම ලංසුව ඉදිරිපත් කර ඇති එස්.එම්.අනිල් පාලිත මහතා වෙත රු.391,786/= ක මුදලකට 2021.11.16 දින විකිණීමෙන් පසු එම මුදල ආදායමට බැර කරන ලදී. 2021 වර්ෂය අවසන්වීමට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නියමයන් ක්‍රියාවට නංවා ඇති බව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම දෙපාර්තමේන්තුවේ සිට පිටතට ස්ථානමාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.120,741/-ක මුදල, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. සේවය අතහැර ගිය නිලධාරියා සම්බන්ධයෙන් ද ඉදිරි කටයුතු කරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම	2020 වර්ෂයේ COVID 19 වසංගතය හේතුවෙන් සහ මෙම දෙපාර්තමේන්තුවේ රියදුරු මහතුන් ප්‍රමාණවත් නොවීම හා සියලු රියදුරු මහතුන් බස්නාහිර පළාතෙන් පිටත පදිංචි කරුවන් බැවින් ක්‍රමාණුකූලව ඔවුන් සේවයේ යොදවාගත නොහැකි වීමෙන් ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නිසි පරිදි පවත්වාගෙන යා නොහැකි වී ඇත. නමුත් මේ වන විට රියදුරු මහතුන් ලිඛිතව දැනුවත්

	කර නිසි පරිදි ධාවන සටහන් හා මාසික සාරාංශ පවත්වා ගැනීමට කටයුතු කර ඇති අතර 2022 වර්ෂයේ සිට එකී වාර්තා විගණකාධිපති වෙත යැවීමට ද කටයුතු කර ඇත.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම.	2020 වර්ෂයේ COVID 19 වසංගතය හේතුවෙන් නිලධාරීන් සේවයට පැමිණීමට නොහැකි වීමෙන් 2020 කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අතර එම වාර්තාව 2022.06.28 වන දින පාර්ලිමේන්තුවට භාර දී ඇත. නමුත් පසු වර්ෂයේ එනම් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නියමිත දිනට පෙර එනම් 2022.06.28 දින පාර්ලිමේන්තුවට භාර දී ඇත.
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබීම.	නියෝජිතයන් දෙදෙනා පිළිබඳව එවකට මෙම දෙපාර්තමේන්තුව අයත්ව පැවති මුදල් අමාත්‍යාංශය වෙත 2022.03.02 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත දිනකට ලැබෙන අයදුම්පත් වලින් අවම වශයෙන් අයදුම්පත් 30 ක් සඳහාවත් එක් නිලධාරියෙකු ක්‍රියාමාර්ග ගත යුතු බවට නියෝග කර තිබීම මෙන්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වාර්ෂික කාර්යසාධන වාර්තා ඇගයීමේදී අදාළ කාලය තුළ මෙම නිධාරියා විසින් නිරත වූ රාජකාරී පිලිබඳ සමාලෝචනය කිරීම මේ යටතේ දැනට ක්‍රියාත්මක වේ.
රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලදි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබීම.	2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් කණ්ඩායම් වශයෙන් රැස්වීම් සෞඛ්‍ය අංශ විසින් අනුමත කර නොතිබුණු වකවානුවක වුවද ආයතනයේ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා හිමිකර දී තිබේ.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම.	ඉදිරියේදි ගිවිසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සටහන් කරගන්නා ලදි.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෝෂ්ඨ නිලධරයකු නම් කර නොතිබීම.	ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් නිලධරයකු පත්කර ගැනීමට සටහන් කරගන්නා ලදි.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමකත පැවතීම.	2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් කණ්ඩායම් ලෙස ඒකරාශී වී පුහුණු සැසි නොපැවැත්වූවත් 2021 වර්ෂයේ ආයතනය මගින් නිළධාරීන් 58 ක් වෙනුවෙන් පුහුණු අවස්ථා ලබා දී ඇති අතර එය සමස්ථ කාර්යමණ්ඩලයෙන් අඩකට ආසන්න වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
" සමාගම් මැදුර "
අංක. 400, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
" සමාගම් මැදුර "
අංක. 400, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.

දෙපාර්තමේන්තුවේ නම : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ කොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම	වාහන අපහරණය කිරීමට පත්කළ කමිටුවේ යාන්ත්‍රික් ඉංජිනේරුවරයකු නොමැති වූ බැවින්, යාන්ත්‍රික් ඉංජිනේරුවරයකු ඇතුලත් කර නව කමිටුවක් පත් කරන ලදි. එම කමිටු වාර්තාව සමග වාහන අපහරණය කිරීමට අනුමැතිය ඉල්ලා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරමින් පවතින බව අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන නොතිබීම	අදාල ලොග් පොත් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම	රට තුළ පැවති ගෝලීය කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් සහ ඉන්ධන ලබා ගැනීම සඳහා QR පහසුකම හඳුන්වා දීමත් සමග ඉන්ධන ලබා ගැනීම සීමා විය. එබැවින් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය. නමුත් මේ වන විට දිස්ත්‍රික් කාර්යාලය වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර අදාල වාර්තාව ප්‍රධාන කාර්යාලය වෙත එවන මෙන් දන්වා ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ ඉන්ධන දහන පරීක්ෂාව සඳහා කමිටුවක් පත් කර ඇත
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම	2020 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුවට ගෙවීම් කිරීමට ඉදිරිපත් නොවූ චෙක්පත් අතරින් රු. 7,700.00 ක වටිනාකමකින් යුතු චෙක්පත හැර අනෙකුත් සියළුම චෙක්පත් උපලබ්ධි වී ඇත. එසේම මෙම රු. 7,700.00 ක් වටිනාකමින් යුත් චෙක්පතද, 2020 වර්ෂය තුළදී දින දීර්ඝ කර ලබා දී තිබුණද බැංකුව වෙත ප්‍රේෂණය සඳහා ඉදිරිපත් නොවූ බැවින් ගෙවීම් අත්හිටුවා රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.
හිඟහිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබීම	2020.12.31 දිනට හිඟ හිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කර එම වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිනුම සැසඳීම ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම	ගන්නාලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය - ඇමුණුම 01
පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම	2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සඳහා ප්‍රඥප්තියක් නොතිබූ අතර, මෙම කාර්යය ඉටු කිරීම සඳහා සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත
ආයතනයේ පුරවැසි / සේවාලාභී	

ප්‍රඥප්තියක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	කමිටුවක් පත්කළ යුතු බව අවස්ථා කිහිපයකදී සාකච්ඡා කරනු ලැබිණි. දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම සඳහා කමිටුවක් 2022.06.16 දිනැති DCS/ADG(Admin)/01 දරන ලිපිය මඟින් පත්කරන ලද අතර, එම කමිටුව විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම සිදු කර ඇත.
රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම	මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ හැකියාව වර්ධන අරමුණු කර ගත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් අප දෙපාර්තමේන්තුව විසින් මුල්වරට සකස් කරනු ලැබුවේ 2017 වර්ෂයේදි, එනම් 2018/01/24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 නිකුත් කිරීමට පෙරදීය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 හි 5 ඡේදයේ දක්වා ඇති පරිදි අප ආයතනයට අනන්‍ය වූ ක්‍රමවේදයක් අනුගමනය කරමින් මෙම සැලැස්ම සකස් කර තිබුණ බැවින් චක්‍රලේඛයේ ඇමුණුම 2 ප්‍රකාර මානව සම්පත් සැලැස්මක් සකස් නොකරන ලදී. කෙසේ වෙතත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 හි 5 ඡේදයේ දක්වා ඇති පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ඉදිරියේදී පිළියෙල කිරීම සඳහා කටයුතු කරමි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබීම	2020 වර්ෂයෙහි දෙපාර්තමේන්තු පුහුණු සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් ගේ හැකියාව වර්ධන අරමුණු කර ගත් අනිවාර්ය පුහුණු අවස්ථා තහවුරු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම	කෙසේ වුවද 2020 මුදල් වර්ෂය තුළ රට තුළ පැවති දරුණු කෝවිඩ් වසංගත තත්වය නිසා පැවති නිරෝධායන ඇඳිරිනීතිය හේතුවෙන් අදාළ වර්ෂය තුළ සැලසුම් කල බොහෝ වැඩසටහන් සැලසුම් කල අකාරයට සිදුකිරීමට නොහැකිවිය. රජය මඟින් මාර්ග ගත ක්‍රමය ඔස්සේ රාජ්‍ය ආයතන වල රාජකාරී පවත්වාගන යන ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් දැනුම් දි තිබුනද ඒ වන විට රටේ පැවති වාතාවරණය හමුවේ අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු සිදුකල ද පුහුණු වැඩසටහන් නිසි ක්‍රමවේදයන්ට අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාතාවරණය සකස් වී නොතිබුණි. එමෙන්ම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තාක්ෂණික ගණයේ දෙපාර්තමේන්තුවක් වන බැවින් තාක්ෂණික කරුණු මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනුවත් කිරීම එතරම් ප්‍රතිඵලදායක නොවේ. මෙම කරුණු නිසාවෙන් සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණු අවස්ථාවක් ලබාදීමට නොහැකි විය.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ධාරිතා හා නිපුණතා සංවර්ධන	රාජකාරිමය වශයෙන් ලිඛිතව ඡ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්කර නොතිබූ නමුත් පුහුණු අංශයේ අධ්‍යක්ෂ

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම්කර නොතිබීම	යටතේ මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදුකරන ලෙසට උපදෙස් දී තිබුණි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් මෙතෙක් සකස් කර නැත

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පී.එම්.පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක: 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.

2020 වර්ෂයට අදාළ ණය ශේෂවල සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය

	නිලධාරියාගේ නම හා තනතුර	ණය වර්ගය	ශේෂය	විස්තරය
සේවය හැරගිය නිලධාරී				
1	ජී.එන්.පෙරේරා (සංඛ්‍යාලේඛනඥ)	ආපදා	රු. 23,320.00	ණය මුදල කපා හැරීම සඳහා අමාත්‍යාංශ අනුමැතිය MFI/02/25/DCS/EST-57 හා 2023.02.09 දින ලැබුනු අතර, අදාල වැය විෂය 2023 ඇස්තමේන්තුවේ නොමැති බැවින් එම වැය විෂය සඳහා රු.23,320/= ක මුදල සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.
2	එම්.ඒ.ඩී.ජී. පෙරේරා (කා.සේ.සේ.)	ආපදා	රු. 27,305.00	2022 දෙසැම්බර් මස ණයශේෂ කපාහැර ඇත.
3	ඊ.පී.ජේමන්ඩි සිල්වා (ලිපිකරු)	ආපදා	රු. 17,500.00	2021 ඔක්තෝම්බර් මස නිරවුල් කර ඇත.
4	ආර්.පී.එල්.යුසන්ත (කා.සේ.සේ.)	ආපදා	රු. 17,050.00	රු.16,650.00 ක් වූ ණය ශේෂයෙන් රු.400.00 ක මුදලක් නිරවුල් කර ඇත. ඉතිරි මුදලද නිරවුල් කරන ලෙසට ණයකරුට වරින් වර දැනුවත් කර ඇත.
5	ඩබ්.එම්.ජේ.සී.වීරකෝන් (සංඛ.නිල.)	උන්සව -3,800/= ආපදා - 23,280/=	රු. 27,080.00	2022.09.29 දින ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙතින් අප දෙපාර්තමේන්තුව සිදු කල විමසීමට පිළිතුරු ලෙස එම දෙපාර්තමේන්තු විසින් DIE/IT/19/01 හා 2022.11.16 දින අප වෙත ලිපියක් යොමු කර ඇත. ඒ අනුව මෙම නිලධාරි මහතා හට ජාතික හැඳුනුම්පත් අංක 711072276V සඳහා අංක N 9199687 දරණ විදේශ ගමන් බලපත්‍රය 2021.12.09 දින නිකුත් කර ඇති බව දන්වා ඇත. ඇපකරු වෙත ද මෙම ණය මුදල ගෙවීම සම්බන්ධව සිහිකැඳවීම් ලිපි යවා ඇත.
6	ඒ.සී.එම්.එස්.කුමාර (සංඛ.නිල.)	උන්සව -600/= ආපදා - 37,810/=	රු. 38,410.00	C/36/2020 (Sk) හා 2022.10.27 දින දරණ නීතිපති දෙපාර්තමේන්තුව මගින් අප දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මඟින් නිලධාරියාගේ නිවැරදි ලිපිනය සොයා ගත නොහැකි වන්නේ නම් ලිපි ගොනුව වසා දැමීමට සිදු වන බව දන්වා ඇත.
7	ඩබ්.ඒ.ජේ.එස්.කුමාර (ද.ස.ක්‍රි./ කේ.ලි.)	ආපදා	රු. 47,150.00	නීතිපති වෙත යොමු කර ඇත.
8	කේ.එම්.ඩී.ආර්.ප්‍රියදර්ශනී (ද.ස.ක්‍රි./කේ.ලි.)	ආපදා	රු. 78,200.00	නීතිපති වෙත යොමු කර ඇත.
9	ටී.එච්.සරත් (කා.සේ.සේ.)	ආපදා	රු. 18,018.00	2022 නොවැම්බර් මස දී සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇත.

10	එම්.ජී.ඩී.කේ.ප්‍රියකැළුම් (කා.සේ.සේ.)	ආපදා	රු.104,250.00	මෙම ණය මුදල අය කර ගැනීමේ ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත HR10/කා.සේ.සේ./192/2 හා 2023.03.16 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.
11	එම්.බී.ආර්.ජේ.බණ්ඩාර (සංඛ්‍ය.සහකාර)	උත්සව- 5000/= ආපදා - 90,140/=	රු. 95,140.00	නීතිපති වෙත යොමු කර ඇත.
12	එම්.එස්.එම්.සන්‍රාස් (කා.සේ.සේ.)	ආපදා	රු. 59,784.00	නීතිපති වෙත යොමු කර ඇත.
	විශ්‍රාම ගිය නිලධාරීන්			
13	එච්.ඩබ්.දයා රංජිත්	උත්සව -1,250.00 ආපදා -39,930.00	රු. 41,180.00	2021 අප්‍රේල් මස දී නිරවුල් වී ඇත.
	මියගිය නිලධාරීන්			
13	ආර්.ජී.එම්.එල්.එච්.කේ. බණ්ඩාරනායක (ද.ස.ක./ කේ.ලි.)	උත්සව	රු. 2,700.00	2021 වර්ෂය තුලදී නිරවුල් කර ඇත.
14	ඊ.එස්.සී.දයාරත්න (සංඛ්.නිල.)	උත්සව -2,500/= විශේෂ - 400/= ආපදා - 63,000/=	රු. 65,900.00	2022 ඔක්තෝබර් මස නිරවුල් වී ඇත.
15	කේ.විග්නේෂ්වරන් (ද.ස.ක්‍රි./කේ.ලි.)	උත්සව - 3,750/= ආපදා - 89,000/=	රු. 92,750.00	මරණ පාරිතෝෂිකය සැකසීමට අදාල ලියකියවිලි නිවැරදි කර ආපසු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මරණ පාරිතෝෂිකය ප්‍රදානය කල පසු නිරවුල් කිරීම සිදු කල හැක.

දෙපාර්තමේන්තුවේ නම : ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම .	එකඟ වෙමි. 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර ඇති බැවින් 2021 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සුදානම් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද, අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම.	එකඟ වෙමි. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	2020 හා 2021 වර්ෂ වල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් හා 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා ඉන්ධන අර්බුදය හමුවේ කාර්ය මණ්ඩලය නිසි පරිදි වාර්තා නොකිරීම නිසා 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාල සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත කාලවකවානු තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වුණි. නමුත් සියලුම වාර්තා මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි. ඉදිරියේ දී නියමිත කාල වකවානුව තුල අදාල වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරමි.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම.	2020 වර්ෂය තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සේවයට වාර්තා කිරීම හේතුවෙන් නියමිත පරිදි ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොමැත. නමුත් 2021 වර්ෂයේ මාර්තු මාසයේ සංචිත වාහන වල ඉන්ධන පරීක්ෂාවන් සිදු කර ඇති අතර, නැවත 2022 වර්ෂයේ පැවති ඉන්ධන අර්බුදය හා ඉන්ධන සපයා ගැනීමේ දී පවතින සීමා හමුවේ වාහන වල ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට නොහැකි වීම හේතුවෙන් එම වර්ෂයට අදාල ඉන්ධන පරීක්ෂාව ද සිදු කිරීමට නොහැකි විය. ප්‍රමාණවත් ලෙස ඉන්ධන ලබා ගැනීමට හැකි වූ පසු නිසි පරිදි ඉන්ධන පරීක්ෂාව සිදු කරමි.
මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබීම.	එකඟ වෙමි. ඉදිරි වර්ෂයන් වලදී ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර නොගැනීමට කටයුතු කරමි.

වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය අයකර ගැනීම සඳහා ගනුලැබූ ක්‍රියා මාර්ග පහත දැක්වේ .

දිනය	ණය අයකර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
2015.09.03	එම්.එස්.පී. පෙරේරා මහතා රජයෙන් ලබාගත් ණය මුදල් හා අඩ වැටුප් නිවාඩු වෙනුවෙන් මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඔහුට දැන්වීම.
2015.10.07	රජයෙන් ලබාගත් ණය මුදල් හා අඩ වැටුප් නිවාඩු වෙනුවෙන් අයකර ගැනීම සඳහා එම්.එස්.පී. පෙරේරා මහතාට යැවූ ලිපියට පළමු සිහිකැඳවීම් ලිපිය යැවීම.
2015.11.03	රජයෙන් ලබාගත් ණය මුදල් හා අඩ වැටුප් නිවාඩු වෙනුවෙන් අයකර ගැනීම පිළිබඳව දෙවන සිහිකැඳවීම් ලිපිය එම්.එස්.පී. පෙරේරා මහතා වෙත යැවීම.
2015.11.18	එම්.එස්.පී. පෙරේරා මහතාගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කෝට්ටේ වෙත දැන්වීම.
2016.06.09	රජයෙන් ලබාගත් ණය මුදල් හා අඩ වැටුප් නිවාඩු වෙනුවෙන් අයකර ගැනීම පිළිබඳව තෙවන සිහිකැඳවීම් ලිපිය එම්.එස්.පී. පෙරේරා මහතා වෙත යැවීම.
2016.06.09	එම්.එස්.පී. පෙරේරාගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කෝට්ටේ වෙත පළමු සිහි කැඳවීම් ලිපිය යැවීම.
2016.10.20	සේවය අවසන් කරන ලද එම්.එස්.පී. පෙරේරා මහතාගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා නීතීපති දෙපාර්තමේන්තුව වෙත යැවීම.
2016.12.08	2017.01.06 දින අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ පරිපාලන නිලධාරී නීතීපති දෙපාර්තමේන්තුවට ගොස් එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ පූර්ව නීතී සාකච්ඡාවකට සහභාගී වීම.
2018.07.23	ඉදිරි නීතිමය පියවර ගැනීම සඳහා ණය ගිවිසුම් සහතික පිටපත් හා ගිණුම් ප්‍රකාශයේ සහතික පිටපත් නීතීපති දෙපාර්තමේන්තුවට 2018.07.23 ඉදිරිපත් කිරීම.
2018.10.15	නීතිපති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු ණය මුදල් 2018.10.15 දින සිට දින 30 ක් ඇතුලත ගෙවන ලෙසත්, මුදල් නොගෙවුවහොත් එකී ණය මුදල හා ඒ මත නෛතික පොලිය ද නඩු ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා වෙනත් කිසිදු දැන්වීමකින් තොරව නඩු පවරන බවටත් එම්.එස්.පී. පෙරේරා මහතා වෙත පෞද්ගලික ලිපිනයට එන්තරවාසියක් යොමු කිරීම

	2018.12.03	නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2018.11.08 දිනැතිව එම්.එස්.පී. පෙරේරා මහතාගෙන් රජයට අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා සකස් කරන ලද පැමිණිල්ලක කෙටුම්පත නිවැරදිතාවය පරීක්ෂා කිරීමට හා පැමිණිල්ල ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛනවල සහතික පිටපත් ලබා දෙන ලෙසට කරන ලද දැනුම්දීමට අනුව පැමිණිල්ල ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛනවල සහතික පිටපත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
	2019.01.09	නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම්.එස්.පී. පෙරේරා මහතා වෙත යොමු කල එන්තරවාසිය "පදිංචියේ නැත" යනුවෙන් ආපසු හරවා එවා ඇති බැවින්, ඔහුගේ වර්තමාන ලිපිනය ලබා දෙන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2018.12.11 දිනැතිව කරන ලද දැන්වීම අනුව එම්.එස්.පී.පෙරේරා මහතාගේ පදිංචිය තහවුරු කරන ලෙස, 2018.12.19 දිනැතිව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් හා 2019.01.09 දිනැතිව මැතිවරණ කොමසාරිස් විමසීම.
	2019.03.12	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් විසින් එම්.එස්.පී. පෙරේරා මහතා වසරකට පමණ පෙර පදිංචි නිවස විකුණා පදිංචිය හැර ගොස් ඇති බව 2019.02.05 දිනැතිව දන්වා ඇති බැවින් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු මැතිවරණ කාර්යාලය වෙත ගොස් වාචිකව විමසීමෙන් පසුව එම්.එස්.පී. පෙරේරා මහතාගේ ලිපිනය පිළිබඳව දැනුවත් වී එම තොරතුරු නීතිපති දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
	2019.06.20	නීතිපති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු ණය මුදල් 2019.05.10 දින සිට දින 30 ක් ඇතුලත ගෙවන ලෙසත්, මුදල් නොගෙවුවහොත් එකී ණය මුදල හා ඒ මත නෛතික පොලිය ද නඩු ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා වෙනත් කිසිදු දැන්වීමකින් තොරව නඩු පවරන බවටත් එම්.එස්.පී. පෙරේරා මහතා වෙත නව පෞද්ගලික ලිපිනයට කරන ලද දැනුම් දීම අනුව මෙම දෙපාර්තමේන්තුවට 2019.06.20 දින තෙක් ප්‍රතිචාර ලැබී නොමැති බව නීතිපති දෙපාර්තමේන්තුව දැන්වීම.
	2019.11.27	එම්.එස්.පී. පෙරේරා මහතාගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇති බවත්, 2020.03.20 දින සිතාසි වාර්තා කැඳවීමට නියමිත බවත් නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත දැන්වීම.
	2020.06.18	2021.01.22 දින සිතාසි වාර්තා කැඳවීමට නියමිත බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත දැන්වීම.

	2021.01.26	එම්.එස්.පී. පෙරේරා මහතා විසින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2020.09.12 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනය අභියාචනය සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව හා අදාල පරිශීෂ්ය වාර්තා ඉදිරිපත් කරන ලෙස 2020.10.19 දිනැතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම දෙපාර්තමේන්තුවට කල දැනුම්දීමට අනුව, මෙම නිලධාරියා සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බැවින් එම ලිපිගොනු නිදහස් කිරීමේ අපහසුතාවය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම.
	2021.04.07	එම්.එස්.පී. පෙරේරා මහතා විසින් එන්තර වාසියට ලබා දුන් පිළිතුරු සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
	2021.11.02	නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි ඉහත නිලධරයා විසින් 2021.07.11 සමථ ඉල්ලීමක් සිදුකර ඇති බවත්, එය සලකා බැලීමට මෙම නිලධරයා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම ප්‍රථමයෙන් තීරණය කළයුතු බවත්, ඒ සඳහා ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට නීතිපතිවරයාගේ උපදෙස් ලබාගැනීමට ලිපියක් යැවීම.
		එම්.එස්.පී. පෙරේරා මහතා සම්බන්ධයෙන් වන ණය ශේෂ අයකර ගැනීමට අදාලව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත. කෙසේ වෙතත් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත එම්.එස්.පී. පෙරේරා මහතා විසින් සමථ ඉල්ලීමක් සිදු කර ඇත. එම සමථ ඉල්ලීම සලකා බැලීමට, ප්‍රථමයෙන් මෙම නිලධාරියා නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධව සලකා බැලිය යුතු බැවින්, ඒ සඳහා ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව අදාල වාර්තා සමගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොනිබීම.	2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල නොහැකි විය. නමුත් ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කරමි.	
පූරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොනිබීම	2020 වර්ෂය තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සේවයට වාර්තා කිරීම මත 2020 වර්ෂය තුල දී මෙම දෙපාර්තමේන්තුවේ පූරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර නොනිබුනි. නමුත් මේ වන විට මෙම	

ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම	දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කරමින් පවතී. ඒ සමගම පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමි.
රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	2020 වර්ෂය තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සේවයට වාර්තා කිරීම මත 2020 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුනි. නමුත් මෙම දෙපාර්තමේන්තුව සඳහා 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇති අතර, 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් මේ වන විට මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබීම	2021 හා 2022 වර්ෂ වෙනුවෙන් සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම අනුව ,එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබූ නමුත්, 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් මේ වන විට සකස් කරමින් පවතින මානව සම්පත් සැලැස්මේ එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කිරීමට කටයුතු කරමි.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබීම	2021 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, වැඩසටහන් සංවිධානය කිරීම, සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම, මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) ටී.ඒ.ඩී.ඩී. ප්‍රේමරත්න මහතා වෙත පවරා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ කදෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

අයන්ති ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මූල්‍ය භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුනි.	අතිරික්ත හා ඌනතා කිසිවක් නොතිබුනු අතර භාණ්ඩ වෙන්දේසි කිරීම ඇතුළු අපහරණ ක්‍රියාවලිය මේ වන විට නිසිපරිදි අවසන් කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	ලේඛන නිසි ලෙස යාවත්කාලීන කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවැතීම.	මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකුගෙන් රු. 354,178.90 ක ණය මුදලක් අයකර ගැනීමට තිබූ අතර ඉන් නිලධාරීන් දෙදෙනෙකු මිය ගොස් ඇති අතර එක් අයකු කාර්යාල කාර්ය සහායක සේවයේ තනතුරක් දැරූ අයකු වන අතර ඔහු සේවය හැර ගොස් ඇත. මෙම ණය මුදලින් මිය ගිය එක් නිලධාරියෙකුගේ බිරිඳ විසින් රු. 102,498.60 වූ සම්පූර්ණ ණය මුදල 2022.09.22 දින ද, අනෙක් මිය ගිය නිලධාරියාගේ භාර්යාව ණය මුදල වාරික 10කින් ගෙවීමට එකඟ වී ඇති අතර ඉන් එක් වාරිකයක් වූ රු. 10,000.00 ක මුදල 2022.10.13 දින ද, ගෙවා ඇත. ඒ අනුව අය කරගෙන ඇති මුළු ණය මුදල රු. 112,498.60 ක් වන අතර තව දුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 241,680.30 ක් වේ. තවද සේවය හැර ගොස් සිටින කාර්යාල කාර්ය සහායක සේවක මහතාගේ ණය ශේෂය සම්බන්ධයෙන් රා.මු.ව. 05/2019 හි 03 (ඉ) ප්‍රකාරව කටයුතු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ලිපිගොනුව නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොමැති වීම.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ජූඩ් නිලුක්ෂාන්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
අඩුපාඩු කිසිවක් නොමැත.	අදාළ නැත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මලර්මදි ගංගාදරන්
අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **183**

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර 2022 අගෝස්තු මාසයේ සිට විගණකාධිපති වෙත මාසිකව ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නිම කර නොතිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් නොතිබුණි.	ගෝලීය වසංගතයක් වූ Covid-19 හේතු කොට ගෙන 2020 වර්ෂයේ මාර්තු මස සිට මුළු රටම වරින්වර වසා තැබීම හා කොවිඩ් මාර්ගෝපදේශ අනුව පාඨමාලාවන් නොපැවැත්වීම මත සියළු නිලධාරීන් හට මානව සම්පත් සංවර්ධන සැලැස්මෙන් සහතික වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මාර්ගගත පාඨමාලා පැවැත්වීම ආරම්භ වීමත් සමඟම 2021 මුල් භාගයේ සිට නිලධාරීන් ඒ සඳහා යොමු කිරීම තුළින් පුහුණු අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම කණ්ඩායම් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද වැඩ මුළු කිහිපයක්ද පැවැත්වීමට කටයුතු කර ඇත. මේ වන විට සමස්ථ කාර්ය මණ්ඩලයටම කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා රේගුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **183**

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	රේගු දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලින් තොරතුරු ලබාගෙන අවසාන පිළිතුර සකස් කරන බැවින් යම් ප්‍රමාදවීමක් සිදුව ඇති බව නිරීක්ෂනය වේ. ඉදිරියේදී පිළිතුර මසක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත උපදෙස් ලබා දී ඇත.
වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	වාහන අපහරණය කිරීම සඳහා වාහන හඳුනාගැනීමේ කමිටුව හා එකී වාහන තක්සේරුව සිදු කළ කමිටුව විසින් නිර්දේශ කරන ලද වාහන පමණක් අපහරණය කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	රට තුල පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කිරීමට අපහසු වී ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු .රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	• ගැලපුම් කළ යුතු බවට අනාවරණය කරන ලද ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්, උපලබ්ධි නොවූ ලැබීම්, හඳුනානොගත් ගෙවීම් මේ වන විට නිරවුල් කර ඇත. • මාසිකව බැංකු සැසඳුම සකස් කිරීමේදී ගැලපුම් කළ යුතු බවට හඳුනා ගන්නා ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව යාවත්කාලීනව කටයුතු කරමින් පවතී.
මු. රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	රේගු දෙපාර්තමේන්තුවේ විශාල උප කාර්යාල ප්‍රමාණයක් පවතින හෙයින් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුවද බැරකම් සම්බන්ධව වාර්තාවීම ප්‍රායෝගිකව සිදුවන හෙයින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සිදුව ඇත. එසේ වුවද ඉදිරියේ දී ප්‍රතිපාදන සීමාව තුල බැරකම් ඇතිකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ගිහ ණය ශේෂ පැවතුණි.	• වසර 05ට වැඩි ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් එක් නිලධාරියකුගෙන් ණය ශේෂය අයකර ගෙන ඇති අතර , අනෙකුත් නිලධාරීන් තිදෙනා සම්බන්ධව තොරතුරු ඉල්ලා රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු , පළාත්

	සහා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති අතර, තොරතුරු ලද පසු එම නිළධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. • වැඩ තහනම් කරන ලද නිලධාරීන් 15 දෙනාට අදාළව විනය පරීක්ෂණ කටයුතු තවදුරටත් පවතින බැවින් එය අවසන් වූ පසු එම නිලධාරීන්ගෙන් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. • මිය ගිය නිලධාරීන් 06 දෙනා හා විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනා සම්බන්ධව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති අතර, තොරතුරු ලද පසු එම නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණය ශේෂ අයකිරීමට කටයුතු කරනු ලැබේ. • වසර 05ට වැඩි විවිධ හේතූන් මත නිරවුල් නොවූ ණය ශේෂයන්ගෙන් රු.25000.00 වඩා අඩු ණය ශේෂයන්, පොත්වලින් කපා හැරීම සඳහා 2022.12.30 දින මු.රෙ. 113 අනුව ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියාගේ අනුමැතිය මත රු.229,102.01 ක් පොත් වලින් කපා හරින ලදී.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	පෙන්වා දෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කර ඇත .වර්තමානයේ දී ලබා දෙන තත්කාර්ය අතුරු අග්‍රිම මුදල් රෙගුලාසි ප්‍රකාරව මසක් තුල නිරවුල් කරනු ලැබේ.
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ශ්‍රී ලංකා රේගුවේ වෙබ් අඩවියට එම පහසුකම එකතු කිරීම මේ වන විට සිදු වෙමින් පවතී.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	තිරසර අරමුණු හඳුනාගෙන ඇත. 1. රාජ්‍ය ආදායම නිසි ලෙස රැස් කිරීම 2. අන්තර්ජාතික වෙළඳාම සඳහා පහසුකම් සැපයීම 3. රේගු නීතිය හා අදාළ අනෙකුත් නීති බලාත්මක කිරීම සහ වංචාවලට එරෙහිව පියවර ගැනීම 4. සමාජ, පරිසර සහ ජාතික උරුමයන් ආරක්ෂණය සඳහා කටයුතු කිරීම
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ළඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	හඳුනාගත් අරමුණු හා ඉලක්ක ළඟා කිරීම සඳහා ඒ ඒ අරමුණු අනු ශීර්ෂයන් යටතේ බෙදීමට ලක් කර ඇත. ඒවා දෙපාර්තමේන්තුවේ අදාළ අංශ වෙත යොමු කර ඇති අතර ඒ ඒ අංශ මගින් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්ම සහ ඒ පදනම් කර ගනිමින් කාර්ය සාධන සැලැස්මද සැකසීම සඳහා පියවර ගෙන ඇත.
ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන	ආයතනයේ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ නිශ්චිත පාර්ශව හඳුනාගෙන ඇති

නොතිබුණි.	අතර ඒ ඒ පාර්ශවයන් ලෙස හඳුනාගෙන ඇති දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා උප අංශ වෙත ඉලක්ක ලබා දී ඇත.
20/18 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/05 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	මේ සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.
පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසිපරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	රේගු කාර්ය භාරය අන්තර්ජාතික වෙළඳාම සමඟ සෘජුව බැඳී ඇති අතර, සැමවිටම අන්තර්ජාතික ප්‍රඥප්ති හා අන්තර්ජාතික ගිවිසුම් ප්‍රකාරව ඉටු කළ යුතුව ඇත. කියෝටෝ සම්මුතිය (RKC) සහ ලෝක වෙළඳ සංවිධානය සමඟ අත්සන් කිරීමට යෙදුනු වෙළඳාමට පහසුකම් සැපයීමේ ගිවිසුම (WTO-TFA) ඒ සඳහා උදාහරණ කිහිපයකි. ඒ අනුව සේවා සැපයීම පිළිබඳව සාදනු ලබන ප්‍රඥප්ති සැමවිටම අන්තර්ජාතික ගිවිසුම් හා ප්‍රඥප්තිවල අන්තර්ගතයන් හා අනුකූල විය යුතුය. රේගුව මේ වන විටත් රේගු කාර්යභාරයට අදාලව සේවාලාභීන් උදෙසා වූ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටින් (SOP) හඳුනාගෙන ඇති අතර, ඒවායින් යම් ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කර ඇත. එසේම විශේෂයෙන්ම ආනයන සේවා සම්බන්ධව කාලය මුදා හැරීමේ අධ්‍යයනයන් සිදු කරනු ලබන අතර ඒ අනුව ඒ ඒ කාර්යයන් සඳහා ගතවන කාල සීමාවන් අධ්‍යයනය කර ඒ පිළිබඳ තොරතුරු ජනතාවගේ දැනගැනීම සඳහා අන්තර්ජාලයටද යොමු කර ඇත. රේගු වෙබ් අඩවියට පිවිසීම තුළින් සේවාලාභීන්ට අවශ්‍ය තොරතුරු වෙත ළඟාවිය හැකි අතර, අන්තර්ජාතික වෙළඳාමට අදාල තොරතුරු ජනතාවට ලබාදීම සඳහා රේගුවේ විශේෂ විමසීම් මධ්‍යස්ථානයක්ද පිහිටුවා ඇත.
ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂනය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ සේවා සැපයීම් වලට අදාල කටයුතු අන්තර්ජාතික ගිවිසුම් හා ප්‍රඥප්ති ප්‍රකාරව සිදු කරනු ලබන අතර එකී කාර්යභාරයන් මේ අවස්ථාව වන විට ලෝක බැංකු නියෝජිත කණ්ඩායමක් විසින් අධීක්ෂණය කරනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/දෝෂ නිවැරදි කරවා ගෙන නොතිබුණි.	ඉදිරියේදී මෙකී දෝෂ ඇති නොවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ශ්‍රී ලංකා රේගුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

ජී.ඩී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතුකර ඇත.
ලැබෙන වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ලැබෙන වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වන විට හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.	පසු ගිය වර්ෂයන්හි රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් කාර්යාල නිසි පරිදි නොපැවැත්වීම හා නිලධාරීන් සේවයට පැමිණීමේ ගැටලු හේතුවෙන් ලැබී තිබූ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ යම් ප්‍රමාදයක් ඇතිවූවත්, හැකි සෑම විටම විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දී ඇත. මේ වන විට ලැබෙන විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට වැඩ පිළිවෙල යොදා ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.	පසු ගිය වර්ෂයන්හි රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් කාර්යාල නිසිපරිදි නොපැවැත්වීම හා නිලධාරීන් සේවයට පැමිණීමේ ගැටලු හේතුවෙන් ලැබී තිබූ ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ යම් ප්‍රමාදයක් ඇතිවූවත්, හැකි සෑම විටම විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දී ඇත. මේ වන විට ලැබෙන විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට වැඩ පිළිවෙල යොදා ඇත.
මූ.රෙ.134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	වර්තමානයේ සිදුකරනු ලබන සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබයි.
2017.06.26 දිනැති අංක 1 / 2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිළදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කොට නොතිබුණි.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හා 2017.06.26 දිනැති චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව වත්කම් පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා ඉදිරිපත් කළ යුතු ආකාරය පිලිබඳ උපදෙස් ඉදිරියේදී ලබා දෙන බවට සඳහන් වන අතර එසේ පසුව ලබා දෙන උපදෙස්වලට අනුව අදාළ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර ඇත. ඉදිරියේදී ද ලබා දී ඇති උපදෙස් හා ලබා දෙනු ලබන උපදෙස් අනුව තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ.

2017.06.26 දිනැති අංක 1 / 2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	මේ වන විට සම්බන්ධීකරණ නිලධාරියෙකු (Liaison officer) පත්කර ඇති අතර අවැසි සියලු තොරතුරු (ඉඩම්/ගොඩනැගිලි/රථ වාහන) ලබාදීමට කටයුතු කර ඇත.
2016 .03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	රට තුළ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් මෙම කටයුතු නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වූ නමුත් මේවන විට එම කටයුතු අවසන්කර සියලු වාර්තා විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022.02.22 දින 2021 වසරේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් පැවති රැස්වීමේදී සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ලබාදුන් තීරණයට අනුව, සංචිත වාහන සඳහා වන ධාවන සටහන් හා මාසික සාරාංශ රජයේ විගණන අංශය වෙත ලබා දීම 2022.02.28 දින සිට ආරම්භ කර ඇත.
නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රජයේ කාර්යාල වසා තැබීම නිසා 2021 වර්ෂයේ ඇතැම් මාසවල නියමිත දිනට බැංකු සැසඳුම් සකස් කිරීමට හා ශේෂ නිරවුල් කිරීමට නොහැකි වූ නමුත් 2022 වර්ෂයේ නියමිත දිනට බැංකු සැසඳුම් සකස්කර ඉදිරිපත්කොට ඇත.
මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	2022 වර්ෂයේදී මෙවැනි තත්වයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතුණි.	මේ වන විට නිහ ණය ශේෂ අය කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන ඇත. • ඇපකරුවන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම. • මරණ පාරිතෝෂිකවලින් අයකර ගත හැකි ණය ශේෂ අයකර ගැනීම සඳහා මරණ පාරිතෝෂිකය ලබා දීමට අදාල ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. • වැඩ නහනමට ලක්ව ඇති නිලධාරීන්ගේ නිහ ණය ශේෂ අයකර ගැනීම සඳහා අදාල නිලධාරීන්ට ණය මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින අතර ඇතැම් නිලධාරීන්ගේ අධිකරණයේ විභාගවෙමින් පවතින නඩු අවසන් වූ පසු නඩු තීන්දුව අනුව ඉදිරි ක්‍රියා

	මාර්ග ගැනීමට නියමිතව ඇත. • විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ පියවීමට පවතින ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. • වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂයන් පියවන ලෙස ලිඛිතව දැනුම් දී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු මු.රෙ.571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු සිදුකර ඇත.
සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍ර ලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කොට නොතිබුණි.	2022 වර්ෂයේදී නියමිත දිනට වර්ෂ අවසාන මුදල් ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පියවා ඇත.
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසාර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	මෙම චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසාර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පහත සඳහන් නියෝජිතයන් දෙදෙනා පත්කර ඇත. 1.ඒ.ඒ.ඒ. උපුල් කුමාර මහතා - නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් 2.ආර්. පත්බේරිය මහතා - ප්‍රධාන සුරාබදු පරීක්ෂක
ආයතනයේ පූරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අදාළව පූරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස්කර ඇත. මෙම ප්‍රඥප්තිය මහ ජනතාවට ප්‍රදර්ශනය කිරීමටත්, එය අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රම වේදයක් සකස් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
විගණකාධිපතිවරයා විසින් ජේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කොට ඒවා නිවැරදි කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	දැනටමත් යාවත්කාලීන කර, අවසන්ව ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	හැකි සෑම විටකම කඩිනමින් පිළිතුරු සපයනු ලබන අතර, පැවති කොවිඩ් තත්වය හමුවේ රට අගළු දමා තිබීම, දෙපාර්තමේන්තු නිලධාරීන් කඩින් කඩ සේවයට කැඳවීම ආදී හේතු නිසා මෙම කාලසීමාවේදී පිළිතුරු සකස්කිරීම හා සැපයීමේ ප්‍රමාදයක් ඇති විය. නමුත් අදාල තත්වය රට යථාතත්වයට පත්වීමත් සමඟම නිවැරදි කර කඩිනමින් පිළිතුරු සැපයීම සිදුකරන ලදී.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	හැකි සෑම විටකම කඩිනමින් පිළිතුරු සපයනු ලබන අතර, පැවති කොවිඩ් තත්වය හමුවේ රට අගළු දමා තිබීම, දෙපාර්තමේන්තු නිලධාරීන් කඩින් කඩ සේවයට කැඳවීම ආදී හේතු නිසා මෙම කාලසීමාවේදී පිළිතුරු සකස්කිරීම හා සැපයීමේ ප්‍රමාදයක් ඇති විය.නමුත් අදාල තත්වය රට යථාතත්වයට පත්වීමත් සමඟම නිවැරදි කර කඩිනමින් පිළිතුරු සැපයීම සිදුකරන ලදී.
2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2019.12.31 දිනට අදාලව සිදු කල යුතු භාණ්ඩ සමීක්ෂණය 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය මත කාර්යාල විවෘත කිරීම සීමා කිරීම, සංචරණ සීමා පැනවීම හා කාර්යය මණ්ඩලය කැඳවීම සීමා කිරීම හේතුවෙන් නියමිත දිනට අවසන් කිරීම ට නොහැකි වී ඇත. එහෙත් 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සඳහන් පරිදි 2019.12.31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අගෝස්තු සහ සැප්තැම්බර් මාස වල දී විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	පැවති කොවිඩ් වසංගත තත්වය මත භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ කරුණු (අතිරික්ත/ඌනතා) වල ට අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම යම් ප්‍රමාදයක් සිදු වූවද 2021/2022 වර්ෂ තුළදී එම කටයුතු අවසන් කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන්ම 2020 හා 2021 වර්ෂයන් තුළ පමණක් ඇතිවූ විශේෂ තත්ත්වයකි.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට (2023 ජනවාරි සිට) නිවැරදිව යාවත්කාලීනව කරගෙන යනු ලැබේ.

2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට සිදුකිරීමට සැලසුම් සකස්කරන ලද නමුත් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේදී හටගත් ඉන්ධන අර්බුදය මත සහ QR කේත සීමාව හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදුකිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකිව ඇත.
මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු, ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි	2020 වර්ෂයේ දී අතුරු සම්මත ගිණුම පැවති අවස්ථා කිහිපයක දී ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2020 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව, 2020 වර්ෂයේ අග කාර්තුවේ දී සම්මත විය. 2020 වර්ෂය සඳහා සම්මත වූ අවසාන ඇස්තමේන්තුවෙහි වැය විෂය අංක 246-1-1-1302 හා 246-1-1-2001 අදාල ප්‍රතිපාදන ප්‍රමාණය අප ඉල්ලුම් කල ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා අඩු වූ නිසා ඉහත තත්ත්වය උද්ගත විය. 2022 වර්ෂය තුළ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන නොමැත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ මෙතෙක් නිරවුල් නොවූ නිලධාරීන්ගේ විස්තර ඉදිරිපත් කරමි **(ඇමුණුම - 01).**
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2020 හා 2021 වර්ෂයන් තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ප්‍රවාහන ගැටළු මත 2022 මුල් භාගයේ දී කාර්යාල රාජකාරී අඩපණ විය. එම නිසා මෙම තැන්පතු නිරවුල් කිරීමේ කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාදයන් සහිතව කටයුතු කිරීමට සිදුවිය.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ. 371 අනුව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
රැස් කර තිබූ ආදායම් නියමිත කාලය තුල නියමානුකූල ලෙස බැහැර කර නොතිබුණි.	බැංකු වෙත ලැබෙන ආදායම් වලට අදාළ බැංකු නිවැරදි කිරීම් හා අගරුවීම් පද්ධතිගත කිරීම සඳහා අවශ්‍ය ලේඛන අදාළ බැංකු වෙතින් කඩිනමින් ලබා ගනිමින් නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටියි. එසේම පද්ධති මගින් ජනනය කරනු ලබන ආදායම් වාර්තා හා බැංකු වෙතින් ලැබෙන ගිණුම් වාර්තා සැසඳීම් කිරීම් කරමින් දෝෂ හඳුනා ගැනීමේ කටයුතු ද සිදු කරයි. කෙසේ වුවද, කෙටි කාලපරාසයක් තුළ එම ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීම ඉතා අභිශය අපහසු කරුණක් බවද දන්වා සිටිමි.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ආයතනික විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ළඟා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	කාර්ය සාධන ඉලක්ක සකස් කරමින්පවතී.
ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ළඟා කර ගැනීමට අදාල වන නිශ්චිත පාර්ශව හඳුනා ගෙන නොතිබුණි.	නිශ්චිත පාර්ශව හඳුනා ගැනීම අවසන් කර ඇත.

රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්ම කෙටුම්පත් කර අවසන් අතර අනුමැතිය ලබාගත යුතුව ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ඇත.
සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මැතිවරණ කටයුතු හා දෙපාර්තමේන්තුවේ විශේෂ රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් යෙදවීමත්, රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් නිසා සැලසුම් කළ පුහුණු වැඩසටහන් සැලසුම් කළ ප්‍රමාණයට සපුරාලිය නොහැකි විය. නමුත් මේ වන විට අදාළ පුහුණු වැඩසටහන් නිම කර අදාළ විභාගද පවත්වා ප්‍රතිඵල නිකුත් කර අවසන් කර ඇත.
විගණකාධිපති වරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	විගණකාධිපති වරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩී.ආර්.එස්. හපුආරච්චි
දේශීය ආදායම් කොමිසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් විජ්‍යාමිපලම්ම ඒ මාවතහා මාවත
ලක්ෂපතිය 02.

සේවා අංකය	නම	ණය ශේෂය (රුපියල්)	ණය ශේෂය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග
6979	ජී.ඩී. ගුණසිරි මිය	191,514.00	මෙම නිලධාරිනිය මිය ගොස් ඇති අතර අයවිය යුතු දේපල ණය මුදලෙහි ශේෂය අග්‍රහාර රක්ෂණයෙන් අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධව ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.
3460	ඊ.එම්.ජේ.බණ්ඩාර මයා	199,162.00	මෙම නිලධාරියා 2023.01.23 දින නැවත සේවයේ පිහිටුවා ඇත. හිහ වැටුප් ගෙවීමට ද මෙම හිහ ණය ශේෂය එමඟින් අයකර ගැනීමට ද කටයුතු කරමින් පවතී.
3594	එස්.ආර්.පී.වෙලාපුරආරච්චි මයා	252,045.00	හිහ ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.
7570	ඩබ්.එම්.අයි.මධුෂාන් මයා	148,000.00	හිහ ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.
7673	ඩී.ඔ.පී. මිල්රෝයි මයා	120,847.44	අදාළ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.
6509	එම්.ජී.ජේ.එස්. බණ්ඩා මයා	-	මෙම නිලධාරියාගේ ණය ශේෂය වාරික වශයෙන් අය කරනු ලබන අතර 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 13180.25 කි
8093	ආර්.එම්.ඩී. සෙව්වන්දි මිය	-	මෙම නිලධාරියාගේ ණය ශේෂය වාරික වශයෙන් අයවේ.
7625	ආර්.ඩබ්ලිව්.ශාන්තසිරි මයා	4,550.00	පෙර සේවය කළ ස්ථානයක නිල නිවාසය භාර නොදීම හේතුවෙන් පෞද්ගලික ලිපිගොනුව එවීම ප්‍රමාදවී ඇති අතර එම ලිපිගොනුව ලැබෙන විටක්, නිලධාරියා තනතුරේ ස්ථිර කර නොනිබුණි. ස්ථිර කිරීමේ අනුමැතිය ලද පසු හිහ වැටුප් වර්ධක ලබා දී ඇත. නිලධාරියා විශ්‍රාම ගැන්වීමට පෙර අදාල ශ්‍රේණි උසස්වීම සිදු කර ඉන් පසුව විශ්‍රාම ගැන්වීමට නියමිතය. විශ්‍රාම ගැන්වීමේදී එම ණය අය කර ගැනීමට අපේක්ෂා කෙරේ.
7433	එම්.ජී.ජිතසේන මයා	146,380.00	වයස අවු: 45 ඉක්මවීමෙන් පසු දෛනික සේවා පත්වීම් ලබා ඇති නිලධාරියෙකු වේ. වැන්දඹු අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි කිරීම සම්බන්ධව ගැටළු සහගත තත්වයක් හේතුවෙන් වැන්දඹු අනත්දරු අංකයක් නොමැති වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සැකසීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බව. එම උපදෙස් ලබා ගැනීමෙන් පසුව, ඒ අනුව අදාළ ණය අය කර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

දෙපාර්තමේන්තුවේ නම : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන සෑම විගණන විමසුමක් සඳහාම නියමිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	සෑම අභ්‍යන්තර විගණන විමසුමක් සඳහාම නියමිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	WPMY 6615 දරණ යතුරු පැදිය, IECD/8/1/2/3/2012 හා 2022/06/28 දිනැති ලිපියෙන් මුදල් අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි භාරදී ඇති අතර එමගින් අදාල වාහනය 2022.11.16 දිනැතිව වෙන්දේසි කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන හයක් (06) අතුරින් වාහන දෙකක (02) ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇත. පසුගිය කාලයේ පැවති ඉන්ධන අර්බුධය හේතුවෙන් එම පරීක්ෂාව සිදු කිරීම ප්‍රමාද වුව ද ඉතිරි වාහන හතරෙහි ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමින් පවතී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතිණි.	ආර්.ඩී.එම්.ජයවික්‍රම මහතා සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරගෙන යනු ලබන විනය ක්‍රියාමාර්ගයන්හි වත්මන් තත්වය විමසා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021.09.21 දිනැතිව සිහි කැඳවීමක් යවා ඇති අතර පසු අවස්ථා කීපයකදී ලබාගත් දුරකථන ඇමතුම් සඳහා ද සාර්ථක පිළිතුරක් නොලැබිණ. IECD/8/2/15 හා 2023.06.06 දිනැති ලිපියෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දෙවන සිහි කැඳවීම යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අවශ්‍ය උපදෙස් ලද පසු ඉදිරි ක්‍රියා මාර්ග ගත හැක.

මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

ටී.ටී. උපුල්මලී ප්‍රේමසිලුක
ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ කොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.	මේ වනවිට හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	තක්සේරු දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලවල නිලධාරීන් කටයුතු කරනු ලබන්නේ විශාල නිලධාරි හිඟයක් සහිතවය. එම නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන අතර කාර්යාලයට පැමිණීම ඉතා සීමිත බැවින් සමහර අවස්ථාවල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාදයක් සිදුවී ඇතත් සියලු විගණන විමසුම් සඳහා පිලිතුරු ලබාදී ඇත.
2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ මිලදි ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ කොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම.	2022 වර්ෂය දක්වා වන සියළුම වත්කම් මිලදීගැනීම් හා අපහරණ කොරතුරු මේ වන විට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කර ඇත.
2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමණාකරණ චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරනය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබීම.	චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා මේ වන විට නිලධාරියෙකු නම්කර යවා ඇත
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ නිර්දේශ හා අනිකුත් නිර්දේශ පිළිබඳ නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබීම.	ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල 19ක් සහ සංචාරක බංගලා දෙකකට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී යම් ප්‍රමාදයක් සිදු වී ඇතත් මේ වන විට 2021 දක්වා වන කටයුතු සියල්ල අවසන් කොට ඇත.
සංචිත වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.	2020 වර්ෂයේ ධාවන සටහන් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කළ අතර මේ වනවිට මාසිකව ධාවන සටහන් නියමිත පරිදි විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරනු ලබයි.
2016.12.29දිනැති අංක 2016/30 දිනැති රා.ප.ව. 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම.	දෙපාර්තමේන්තුවේ සීමිත වාහන ප්‍රමාණයකින් දෛනික රාජකාරි ඉටුකර ගන්නා බැවින් හා කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ හමුවේ විටින් විට කාර්යාලය වසා තිබූ හේතුවෙන් වාහන කිහිපයක පමණක් ඉන්ධන දහනය වීම පරීක්ෂා කර

	ඇති බව දන්වා සිටිමි.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණයවූ ගැලපුම් කළ යුතු වූ ශේෂ සම්බන්ධව මු.රේ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම.	මේ වන විට ගැලපුම් කලයුතු ශේෂයන් බැංකු සැසඳුම් ප්‍රකාශවල පෙන්නුම් නොකරන අතර මු. රේ. ප්‍රකාරව නියමිත කාලය තුල සියලු ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.
වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ හිඟ ණය ශේෂ පැවතීම.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර රු. 25,000/- අඩු ණය ශේෂ කපාහැරීමට කටයුතු කර ඇත. තවදුරටත් රු. 25,000/- අඩු ණය ශේෂ 03ක් ඇති අතර ඉන් ණය ශේෂ 02ක් අයකර ගැනීම සම්බන්ධයෙන් උපරිම ක්‍රියාමාර්ග ගත් නමුත් තව දුරටත් එම ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වූ බැවින් ණය ශේෂ අත්හැරීමේ නියෝගයක් 2023.02.07 දිනැතිව ලබාගෙන ඇත. මෙම අතහැරීම ගිණුම්ගත කිරීම සඳහා අයවැය සංකේතාංකයක් පිළියෙල කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇති අතර ප්‍රතිපාදන මාරුකර ගැනීමෙන් අනතුරුව කපාහැරීම ගිණුම් ගත කකරනු ලැබේ . නිලධාරීන් තිදෙනෙකුගෙන් ණය අයකර ගැනීම සඳහා නීති නිලධාරි විසින් නීතිමය කටයුතු ආරම්භ කර ඇත.
රැස් කරන ලද ආදායම නියමිත කාලය තුල නියමානුකූල ලෙස බැහැර කර නොතිබීම	සේවාලාභීන් විසින් සෘජුවම බැංකු ගිණුමට සිදුකරනු ලබන බැර කිරීම් හා තැන්පත් කිරීම් වලට අදාල ලේඛන කාර්යාලයට ලැබීම ප්‍රමාද වීම මත ආදායම් සටහන් කිරීමේ යම් ප්‍රමාදයක් සිදු වුවද නිරන්තර පසුවිපරම් තුලින් මේ වන විට මෙම තත්වය අවම කරගෙන ඇත.
සමස්ත කාර්යය මණ්ඩලටයට අයත් කාර්යය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳ 02/2018 චක්‍රලේඛය පාදක කොටගෙන අප දෙපාර්තමේන්තුවට උචිත ආකාරයෙන් සකස් කරන ලද කාර්ය සාධන ගිවිසුම 2023 සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය සඳහා, සහකාර ලේකම් , මානව සම්පත් සංවර්ධන අංශය , රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත 2023.01.04 දින යොමු කොට ඇත. කෙසේ නමුත් 2023.02.01 දින සිට කාර්ය සාධන ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විටත් සිදුකරමින් පවති.
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලදී ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතීම	2019 වර්ෂයේ අවසානයේ සිට පැවති කොවිඩ් වසංගත තත්වය මත කාර්යාල කටයුතු සීමිත ලෙස ක්‍රියාත්මක වීම, මෙන්ම ඉන් අනතුරුව ප්‍රතිපාදන සීමාසහිත ලෙස නිදහස් කිරීම හේතුවෙන්ද පුහුණු වැඩසටහන් අපේක්ෂිත පරිදි සිදු කිරීමට

	නොහැකිවිය. කෙසේ වුවද පෙර වර්ෂවල ලබාදුන් ශිෂ්‍යත්ව වලට අදාල කටයුතු අඛණ්ඩව සිදු කෙරුනු අතර පවතින ප්‍රතිපාදන සීමාවන් උපරිම ලෙස කළමණාකරනය කර ගනිමින් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඡේද වලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කර නොතිබීම	විගණකාධිපති විසින් පෙන්වා දෙනු ලබන විගණකාධිපති වරයා විසින් පෙන්වා දෙනු ලබන දෝෂ ඇති නොවන අයුරින් දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට උපරිම ලෙස කටයුතු කරනු ලැබේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රජයේ ප්‍රධාන තක්සේරුකරු
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

ජී. ඩී. ඩී. එස්. මුතුකුමාරණ
රජයේ ප්‍රධාන තක්සේරුකරු
තක්සේරු දෙපාර්තමේන්තුව
අංක 748, මරදාන පාර,
කොළඹ 10.

දෙපාර්තමේන්තුවේ නම : සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 183

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු දෙවන සහ තෙවන මුර පද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	2004.05.11 දිනැති අංක: 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු , දෙවන සහ තෙවන මුරපද වෙනස් කරන ලද අතර තුන් මසකට වරක් එම මුර පද වෙනස් කිරීමට අවශ්‍ය අභ්‍යන්තර විධිවිධාන සකස් කර ඇත.
විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	නියමිත කාලසීමාව තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් ඇතැම් අවස්ථාවන් හි ප්‍රමාදයන් සිදුව ඇත.එම තත්වය ද පාලනය කර දින 07 ක් හෝ දින 14 ක් තුළ පිළිතුරු සැපයීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කර අවශ්‍ය පියවර ගෙන ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	නියමිත කාලසීමාව තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් ඇතැම් අවස්ථාවන් හි ප්‍රමාදයන් සිදුව ඇත.එම තත්වය ද පාලනය කර දින 07 ක් හෝ 14 ක් තුළ පිළිතුරු සැපයීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කර අවශ්‍ය පියවර ගෙන ඇත.
2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021.07.08 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද නමුත් එහිදී 2016.03.31 දිනැති 5/2016 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි සඳහන් දින අනුව දින හතක කාල ප්‍රමාදයක් සිදුව තිබේ. ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ ප්‍රාදේශීය කාර්යාල 331 ක භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලියෙහි ඇතිවන ඇතැම් සංකීර්ණතා හේතුවෙන් මෙවැනි ප්‍රමාදයන් සිදුවේ. එම තත්වයන් හැකිතාක් පාලනය කර ගනිමින් ජූනි මස 30 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේද විධිමත් කර ඇත.2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2022.06.09 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම මෙම විධිමත් පාලනයට උදාහරණයකි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන්	මේ වන විට සියළුම වාහන සඳහා දෛනික ධාවන

හා මාසික සාරංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සටහන් හා සාරාංශ වාර්තා විගනණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන දෙපාර්තමේන්තුව සතුව නොමැත. නමුත් කාර්මික දෝෂයන්ට ලක්ව වාහන ඇති අතර ඒ සම්බන්ධව තාක්ෂණික කමිටුවක් පත් කර ඒ මඟින් ලබාදී ඇති නිරීක්ෂණ පදනම් කරගෙන වාහනවල අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනම මත පවත්වා නොතිබුණි.	සියළු වාහන සඳහා ලොග් සටහන් පොත් යාවත්කාලීන කරනු ලබයි.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	විගණිත කාලසීමාව තුළ බැංකු සැසඳුම පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම මසක් තුළ අදාල ගණුදෙනු නිරවුල් නොවීමට හේතු වී ඇත. මේ වන විට නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කිරීම සිදුවන බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් හඳුනාගත් නිරවුල් කළ හැකි සියළු ශේෂ මසක් තුළ නිරවුල් කිරීමට කටයුතු කර ඇත. තවදුරටත් පසු විපරම් කර නිරවුල් කළ යුතු ශේෂයන් පවතින සුවිශේෂී අවස්ථාවන් හි පමණක් මසක කාලය තුළ අදාල ගණුදෙනු නිරවුල් කිරීමට නොහැකි වී ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණි.	වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීම පසුගිය වසර කිහිපය පුරාම ක්‍රමානුකූලව පාලනය කර ගැනීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද විධිමත් කිරීම හේතුවෙන් 2022 වර්ෂය වන විට ප්‍රතිපාදන සීමාව ඉක්ම වූ බැරකම් වාර්තා නොවන මට්ටමට එම තත්වය පාලනය කිරීමට හැකියාව ලැබී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුනි.	හිගහිටි ණය ශේෂ පැවතීමට හේතු හඳුනාගනිමින් 2020 වර්ෂයේ පැවති රු 4,766,765.82 ක ණය ශේෂයෙන් රු 1,363,399.00 ක ණය ශේෂයක් නිරවුල් කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේ හිගහිටි ණය ශේෂය වශයෙන් වාර්තා වන රු 3,403,366.82 ට අදාල නිරවුල් කිරීම් ද සිදු කරමින් පවතී.

පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමෙහි පවතින වසර දෙකකට වැඩි සියළු ශේෂ මු.රෙ.571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. එහෙත් එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට සමෘද්ධි අධිකාරිය විසින් ලබාදුන් භාණ්ඩාගාරය විසින් පියවීමට එකඟතාවය ලබාදී තිබූ ණය මුදලෙහි පියවිය යුතු ශේෂය වශයෙන් වසර අටක පමණ කාලයක් පුරා පවතින 2,374,500,000.00 ක ශේෂය නිරවුල් කිරීම සඳහා අවශ්‍ය මුදල් නොලැබීම හේතුවෙන් එය තැන්පත් ගිණුමේ ශේෂයක් ලෙස නිරූපණය වේ. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට පියවිය යුතු ශේෂයක් වන බැවින් තැන්පත් ගිණුමේ ඇති මෙම ශේෂය මු.රෙ.571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හැකියාවක් ලැබී නොමැත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වූ වහාම පියවීමේ ප්‍රමාදයක් විගණිත කාලසීමාව තුළ පැවති නමුත් මේ වන විට තත්කාර්ය අතුරු අග්‍රිම දින 14 ක් තුළ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් අතුරු අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් වළක්වා ගැනීමට හැකියාව ලැබී ඇත.
2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමණාකරණ සේවා වක්‍රලේඛන ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	කාර්තුමය වාර්තා වශයෙන් නොව වර්ෂය අවසානයේ අවසන් කාර්තු වාර්තා මීට පෙර වර්ෂවල යොමු කර ඇති අතර, 2023 වර්ෂයේ සිට කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුමය වශයෙන් වාර්තා සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරමින් පවතී.
ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	www.samurdhi.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ 2015 වසරේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිළ වෙබ් අඩවියක් පවත්වාගෙන යන අතර මෙය දිනපතා යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. මීට අමතරව මහජනතාවට තම පැමිණිලි හා ප්‍රශංසා ලබා දීම සඳහා 0112887722 අංක යටතේ HOT line එකක් හදුන්වා දී ඇත.මෙම HOT line අංකය සමෘද්ධි බැංකුවල පෝස්ටර් මගින් ප්‍රසිද්ධ කර මහජනතාව දැනුවත් කර ඇත.

පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර 2022.04.01 දින අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පර්යේෂණ හා සංඛ්‍යා ලේඛන) වෙත යොමු කර ඇත. තවද පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණ හා ඇගයීම් කටයුතු පිළිබඳ ආයතනය විසින් ගනු ලබන ක්‍රියා පිළිවෙල සම්බන්ධ වාර්තාව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(මානව සම්පත් සංවර්ධන) වෙත විද්‍යුත් තැපෑල (Email) මගින් 2022.03.21 දින යොමු කර ඇත.
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය 2500කට අසන්න වන අතර මහා භාණ්ඩාගාරයෙන් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ලැබෙන සීමිත ප්‍රතිපාදන වලින් නිසි පරිදි සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව අත්‍යවශ්‍ය පුහුණු සඳහා නිලධාරීන් යොමු කරනු ලැබේ. සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වසරකට පුහුණුව ලබා දීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් අවශ්‍යතාවයන් පෙළ ගස්වා තිබෙන ප්‍රතිපාදන වලින් ප්‍රමුඛතා ගතකර පුහුණුව ලබා දෙනු ලැබේ.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. විගණකාධිපතිවරයා විසින් ඡේද වලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	අධිකාරියක්ව පැවති මෙම ආයතනය දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීමත් සමඟම නිලධාරීන්ගේ පැවති ගැටළු සම්බන්ධව ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමට සිදු විය. එහෙයින් නිරීක්ෂණයේ සඳහන් කරුණු සම්බන්ධව කටයුතු කිරීම ප්‍රමාද වුවද මේ වන විට ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 183 සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ආර්. පී. බී. තිලක්සිරි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04 වන මහල, සෙත්සිරිපාය I වන අදියර
බත්තරමුල්ල.